ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

# කොන්ත්‍රාත් පදනම මත විද්‍යාගාර සහායක

# කොන්ත්‍රාත් පදනම මත නිදර්ශක එකතුකරන්නා

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින ඉහත තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් තම ජීව දත්ත තොරතුරු ඇතුලත් වන සේ තමන් විසින් සකස් කරගත් අයදුම්පත්, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික පිටපත් ද සමඟ 2025.01.31 දින හෝ එදිනට ප්‍රථම "නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ" වෙත ලැබීමට සැලැස්විය යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදුනොවන අතර කොන්ත්‍රාත් පදනම මත මෙම පත්වීම ලැබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ස්ථිර තනතුරක් ලැබීමට ද හිමිකම් නොලැබේ.

**<u>කොන්ත්‍රාත් පදනම මත විද්‍යාගාර සහායක</u>**

**සුදුසුකම්:-**

- අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් N.V.Q 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  හෝ

- අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්ද

- වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වෙනත්:-**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප:** රු.50,825/- ක ( මූලික වැටුප රු.28,025.00 + 551:09 (21) පාලක සහා තීරණය ප්‍රකාරව විශේෂ දීමනාව රු.17,800.00 + 525:06 (18) පාලක සභා තීරණය ප්‍රකාරව විශේෂ දීමනාව රු.5,000.00) ස්ථාවර මාසික දීමනාවක් ගෙවනු ලැබේ.